**කල්මුනේ මහා නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 ජුනි 06 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින මහනගර සභාවේ කොමසාරිස්වරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කල්මුනේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**------------------------**

ගිණුම් පිළියෙල කිරීමේදී භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලෙජර ගිණුම අනුව 2016 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් රු.40,259,540 ක්ව තිබුණත්, මූල්‍ය ප්‍රකාශනවල මෙම ශේෂය රු.1,326,606 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ලබාගෙන තිබූ ශේෂ සනාථ කිරීමේ ලිපිය ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කාරෙයිතිවු ප්‍රාදේශීය සභාවට 2016 දෙසැම්බර් 31 දිනට මහ නගර සභාව විසින් ගෙවිය යුතු ගාස්තු රු.2,854,802 ක්ව පැවතියද, එම වටිනාකම ගිණුම්වලට ගෙනැවිත් නොතිබුණි.

(ඇ) පරිත්‍යාග වශයෙන් ලැබී මහා නගර සභාවට අයිතිය මාරු කර තිබූ වාහන 15 කද "නැණසල" වැඩසටහන යටතේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ පරිඝනක 04 කද වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙනැවිත් නොතිබුණි.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**
**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 වර්ෂයේ සිට හිඟහිටව පැවත එන පොදු වෙළඳපොල බදු කුලී රු.12,314,393 ක්, මස් කඩ බදු කුලී රු.5,979,594 ක්, කඩ කුලී රු.13,540,408 ක් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි.

(ආ) 1996 වර්ෂයේ සිට අද දක්වා අයකර ගෙන නොමැති බයිසිකල් හා වාහන ආරක්ෂක බදු රු.3,325,163 ක් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පහත සඳහන් එක් එක් කරුණුවලට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගොඩනැගිලි | 119,239,060 | ස්ථාවර වත්කම් ලේඛනය |
| ලී බඩු හා සවිකිරීම් | 4,751,565 | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,086,250 | |
| මොටර් වාහන සහ කරත්ත | 11,130,013 | |
| මහජන පොල හිඟ බදු කුලී | 12,314,393 | හිඟ බදුකුලී ලේඛනය |

### 1.3.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති යනාදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 252 වන පරිච්ඡේදය 218 වගන්තිය | පරිපාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් සකස් කළ යුතු විස්තරාත්මක වාර්තාව 2016 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | 2014 දෙසැම්බර් 30 දිනැති අංක 03/2014 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මහා නගර සභාවේ සභාපතිවරයාගේ ජාත්‍යන්තර දූරකථන ඇමතුම් සහ අන්තර්ජාල පහසුකම් සඳහා 2015 වර්ෂයේ රු.39,520 ක් ගෙවීම් කර තිබූ නමුත් එම ගෙවන ලද වටිනාකම ඔහුගෙන් 2017 සැප්තැම්බර් 25 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන නගර සංවර්ධන චක්‍රලේඛය | එක් එක් පළාත් සභාව විසින් නගර සංවර්ධනය නමින් වූ බැංකු ගිණුමක් ආරම්භ කර එම ගිණුමට සේවා ගාස්තු සහ දඩ ගාස්තු තැන්පත් කළ යුතු බවට දැනුවත් කර තිබුණත් මහා නගර සභාව විසින් එවැනි බැංකු ගිණුමක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. |

**2.	මූල්‍ය සමාලෝචනය**
---------------------

**2.1	මූල්‍ය ප්‍රතිඵලය**
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.21,251,122 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,716,308 ක් ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,534,814 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2	ආදායම් පරිපාලනය**
----------------------

**2.2.1	වරිපනම් බදු**
------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)	මහා නගර සභා ආඥා පනතේ 252(1)(ආ) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ පදිංචි වී සිටින දේපල හිමියන් 45,545 දෙනෙකුගෙන් 1988 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගත යුතු රු.105,113,556 ක වරිපනම් බදුවලින් සියයට 13 ක් නියෝජනය කෙරෙන රු.14,128,416 ක මුදලක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ)	වරිපනම් බද්ද අයකිරීම සඳහා පත්කර තිබූ ස්ථිර සේවකයින් 05 දෙනෙකුට සහ තාවකාලික සේවකයින් 03 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.2,425,540 ක් වැටුප් වශයෙන් ගෙවා තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේදී ඔවුන්හට අයකර ගත හැකිවූයේ රු.3,028,416 ක හිඟ ආදායමක් පමණි. එසේ වුවත්, එම කරුණ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීයාගේ ප්‍රමාණවත් අවධානය යොමු වී නොතිබුණි.

**2.2.2	මහජන පොළ කඩකුලී අයකිරීම**
---------------------------------

මහා නගර සභාවට අයත් මහජන පොළේ කඩ කාමර 503 කින් කඩ කාමර 64 ක් කුලියට ලබාගත් අයගෙන් හිඟහිටි කඩකුලී රු. 5,130,143 ක් වර්ෂ 06 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

**3.	මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

**3.1	කළමනාකරණ අකාර්යක්ෂමතා**
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)	වෙනත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වාහන 07 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට සභාව විසින් භාවිතා කර තිබූ නමුත්, ඒවා සභාවේ නමට මාරු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ)	වර්ෂ 02 කට පෙර ස්ථාන මාරු වීම් ලබා ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.339,973 ක හිඟ ණය ශේෂය අයකර ගැනීමට 2017 සැප්තැම්බර් 25 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.2 නිෂ්කාර්ය වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් අලුත්වැඩියාවන් සිදුකර භාවිතයට ගත හැකි තත්ත්වයේ පැවැති ට්‍රැක්ටර් 07 ක්, ට්‍රේලර් 04 ක්, වතුර බවුසරයක්, මෝටර් ග්‍රේඩරය (Motor Grader) සහ එක්ස්කැවේටර් (Eskevator) යන්ත්‍රය ආදිය අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර වර්ෂ 02 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් "නැණසල" වැඩසටහන යටතේ නට්පිටිමුනෙයි පුස්තකාලයට 2014 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලබා දී තිබූ පරිගණක 04 ක් 2017 සැප්තැම්බර් 25 දින දක්වා භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පැවැති බව දක්නට ලැබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**3.3.1 ළමා වෙරළ උද්‍යානය**

නේල්සිප් (NELSIP) ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ 2016 ජනවාරි 10 දින සායින්ද මරුදූ ළමා වෙරළ උද්‍යානයේ රු.768,148 ක වියදමින් ඉදිකරනු ලැබූ වැසිකිළියට ජල පහසුකම් ලබා නොදීම හේතුවෙන් එය 2017 සැප්තැම්බර් 25 දින දක්වා භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

**3.3.2 මරුදමුනෙයි මහජන පුස්තකාලයේ ශ්‍රවණාගාරයට වායු සමීකරණ යන්ත්‍ර ස්ථාපිත කිරීම**

මරුදමුනෙයි මහජන පුස්තකාල ශ්‍රවණාගාරය සඳහා කොන්ත්‍රාත්කරු විසින් වායුසමීකරණ යන්ත්‍ර (Air Conditioners) 14 ක්, එකක් රු.204,600 ක් බැගින් වූ රු.2,864,400 ක මිලකට 2016 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, විගණනයට ලිඛිතව ඉදිරිපත් වූ ප්‍රකාශය පරිදි එම වර්ගයේම එම වෙළඳ ලකුණ යටතේ වූ වායු සමීකරණ යන්ත්‍ර එකක් රු.114,900 ක් බැගින් වූ මිලකට සපයා ස්ථාපිත කිරීමට පුද්ගලික ආයතනයක් විසින් එකඟ වී තිබුණි. මේ අනුව කොන්ත්‍රාත්කරුට රු.1,255,800 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

**3.3.3 කල්මුනේ සංචාරක තොරතුරු කේන්ද්‍රයක් ඉදිකිරීම**

සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවට වෙන්කරනු ලැබූ සංවර්ධන සහනාධාර යටතේ කල්මුනේ සංචාරක තොරතුරු කේන්ද්‍රය ඉදිකිරීමේ කටයුතු 2017 අප්‍රේල් 04 දින සම්පූර්ණ කර ඇති බව තාක්ෂණික නිලධාරී විසින් නිර්දේශ කිරීමෙන් රු.2,593,013 ක් ගෙවා තිබුණි. එසේ නමුත් රු.333,000 ක් වටිනා කාර්යයන් 04 ක් නිමකර නොතිබීම හේතුවෙන් 2017 සැප්තැම්බර් 25 දින වන විටත් මහජන භාවිතය සඳහා යොදාගත නොහැකිව නිෂ්ඵලව පැවැතුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 පිළිතුරු නොලත් විගණන විමසුම්**

2011 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා නිකුත් කළ විගණන විමසුම් 28 කින් විගණන විමසුම් 19 ක් සඳහා මේ දක්වා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 නිරවුල් නොවූ විගණන ඡේද

--------------------------------

පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) මහජන පොළට ආසන්නයේ ඇති පුද්ගලික කඩ කාමර මාසිකව රු.10,000 සිට රු.20,000 ක් දක්වා වන කුලියකට බදු දී තිබුණත්, මහා නගර සභාවට අයත් කඩ කාමර 1980 වර්ෂයේ සිට රු.300 සිට රු.2,500 ක් දක්වා වන පරාසයකින් වන කුලියකට ලබාදෙමින් තිබුණි. එසේ වුවත්, වෙළඳපොල තත්ත්වයන් සැලකිල්ලට යොමුකර එයට අනුව කුලිය වැඩිකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආසන්න වශයෙන් වාර්ෂිකව රු.මිලියන 60 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) මස් කඩ බදු කුලී වෙනුවෙන් වන ඇප මුදල් වශයෙන් එකතුව රු.544,154 ක් වන චෙක්පත් 06 ක් ලබාගෙන 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වන කාලපරිච්ඡේදයේ බැංකුවේ තැන්පත් කළ පසු බැංකුව විසින් අගරු කර තිබුණ ද මේ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) කාර්යාලයේ එක් එක් අංශ පිහිටා තිබෙන ස්ථාන දැනුවත් කරන ලීයෙන් තැනූ නාම පුවරු සකස් කර සවිකිරීම සඳහා 2013 වර්ෂයේ රු.123,000 ක් ගෙවීම් කර තිබූ නමුත්, 2017 සැප්තැම්බර් 25 දින වන විටත් අදාළ පුවරු සකස් කර ලබාදී නොතිබුණි. කෙසේ වුවත්, මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාවට වෙන් කරනු ලැබූ සංවර්ධන ආධාර යටතේ 2009 වර්ෂයේ සලසා දී තිබූ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3 ක් ස්ථාවර තැන්පතුවලද, රු.2,468,590 ක් ජංගම ගිණුම්වලද තැන්පත් කර තිබුණි. එසේ වුවත්, අදාළ මුදල් මේ දක්වා සංවර්ධන කටයුතු සඳහා උපයෝගී කරගෙන නොතිබුණි.

(ඉ) මහා නගර සභාවේ නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 2014 දෙසැම්බර් සිට 2015 පෙබරවාරි දක්වා වූ මාස 03 ක් සඳහා වූ රු.13,011 ක ජංගම දුරකථන බිල්පත් සඳහා 2015 වර්ෂයේදී දෙවරක් ගෙවීම් කර තිබූ නමුත් මේ සම්බන්ධයෙන් මේ දක්වා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) මහා නගර සභා අරමුදලින් ශිෂ්‍යයින් සඳහා රු.124,969 ක මුදලකට ඉගෙනීමට අවශ්‍ය උපකරණ තොගයක් මිලදී ගෙන 2015 ජූනි 30 දින කල්මුනේ අල්-අමීන් පාසලට භාරදුන් බව දන්වා තිබුණද, එම විදුහලේ විදුහල්පතිගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශය අනුව එම භාණ්ඩ 2017 සැප්තැම්බර් 25 දින වන විටත් එම විදුහලට ලබා දී නොතිබුණි.

(උ) 2014 වර්ෂයේදී කල්මුනේ ඉස්ලාම්බාත් (Islambath) සුනාමි නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතියේ අපජලය පිරිසිදු කිරීමේ ව්‍යාපෘති කාර්යයන් සඳහා ප්‍රමාන පත්‍රවල (Bill of Quantity) අන්තර්ගත රු.903,520 ක් වටිනා කාර්යයන් 09 ක් කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ කර නොතිබූ නමුත් එම කාර්යයන් ඉටු කළ බවට සහතික කර ගෙවීම් සිදුකිරීම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | අවධානය යොමු කළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම.<br>(ii) ඝන අපද්‍රව්‍ය සේවා ගාස්තු අයකර ගැනීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | මානව සම්පත් නිසි ලෙස බෙදාහැරීම. |
| (ඉ) | තොග පාලනය | විධිමත්ව ගබඩා පාලනය කිරීම. |